# ⑥ ව්‍යාපාර සංවිධාන - පිළිතුරු

(1)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | ② | 2. | ③ | 3. | ④ | 4. | ① | 5. | ③ | 6. | ④ |
| 7. | ① | 8. | ② | 9. | ① | 10. | ③ | 11. | ④ | 12. | ③ |
| 13. | ② | 14. | ④ | 15. | ② | 16. | ① | 17. | ④ | 18. | ③ |
| 19. | ① | 20. | ② | 21. | ② | 22. | ③ | 23. | ② | 24. | ③ |
| 25. | ④ | 26. | ① | 27. | ② | 28. | ① | 29. | ④ | 30. | ② |
| 31. | ④ | 32. | ② | 33. | ④ | 34. | ① | 35. | ③ | 36. | ② |
| 37. | ④ | 38. | ② | 39. | ② | 40. | ④ | 41. | ③ | 42. | ③ |
| 43. | ① | 44. | ② | 45. | ③ | 46. | ④ | 47. | ① | 48. | ② |
| 49. | ② | 50. | ③ | 51. | ④ | 52. | ① | 53. | ④ | 54. | ③ |
| 55. | ① | 56. | ② | 57. | ③ | 58. | ① | 59. | ③ | 60. | ① |
| 61. | ② | 62. | ④ | | | | | | | | |

(2)

1. * පොදු අරමුණක් පැවතීම
   * සීමිත සම්පත් භාවිතය
   * සංවිධාන ව්‍යුහයක් පැවතීම
   * ආර්ථික කටයුත්තක නියැලීම
   * පුද්ගල කණ්ඩායමක් ඒකරාශි වී සිටීම

2. 1. හිමිකාරිත්වය අනුව 2. අරමුණ අනුව

3. 1. පෞද්ගලික අංශයේ ව්‍යාපාර 2. රාජ්‍ය අංශයේ ව්‍යාපාර

4. 1. තනි ස්වාමි ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර
   3. සීමාසහිත පෞද්ගලික සමාගම් 4. වරලත් ව්‍යාපාර

5. 1. දෙපාර්තමේන්තු 2. රාජ්‍ය සංස්ථා
   3. රාජ්‍ය සමාගම්

6. 1. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන
   2. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන

7. 1. පෞද්ගලික රෝහල් 2. පෞද්ගලික බැංකු
   3. සුපිරි වෙළෙඳසැල් 4. ඇඟළුම් නිෂ්පාදන ආයතන
   5. තොග හා සිල්ලර වෙළෙඳසැල්

8. 1. රතු කුරුස සංවිධානය 2. සිංහ සමාජය
   3. ක්‍රීඩා සංගම් 4. සර්වෝදය
   5. ආගමික සංවිධාන 6. සුභ සාධක සංගම් යනාදිය

9. කේවල ස්වාමි ව්‍යාපාර - සමන්ත ස්ටෝර්ස්
හවුල් ව්‍යාපාර - පෙරේරා සහ පුත්‍රයෝ
සී/ස පෞද්ගලික සමාගම් - සී/ස රජරට (පුද්) සමාගම
(මෙවැනි ඕනෑම උදාහරණයක්)

10. 1. ප්‍රාග්ධනය අයිතිකරු විසින් යොදයි.
2. අයිතිය තනි පුද්ගලයෙකු සතුය.
3. ලාභ හෝ පාඩු තනිව භුක්ති විඳියි.
4. අඛණ්ඩ පැවැත්මක් නැත.
5. වගකීම අසීමිත වේ.
6. ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
7. නෛතික පුද්ගලභාවයක් නැත.

11. 1. තමා ඉතිරි කරගත් මුදලකින්
2. තම වත්කමක් විකුණා හෝ ඇපයට තබා ලබාගත් ණය මුදලකින්
3. මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලකින්
4. නෑදෑ හිත මිතුරන්ගෙන් ලබාගත් මුදලකින්

12. බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගත් ණය පියවීම සඳහා ව්‍යාපාරිකයා සතු පෞද්ගලික දේපල පවා කැප කිරීමට සිදුවන බවයි.

13. කේවල ස්වාමි ව්‍යාපාරවලට නෛතික පුද්ගලභාවයක් නොමැති නිසා ව්‍යාපාරයේ නමින් නඩු පැවරිය නොහැක. අයිතිකරු වන අරුණ පෙරේරාට එරෙහිව නඩු පැවරිය යුතුය.

14. ණය පියවීම සඳහා හවුල්කරුවන් තම පෞද්ගලික දේපල පවා යොදවමින් ව්‍යාපාරයේ ණය පියවිය යුතුය.

15. 1. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය
2. ග්‍රාම නිලධාරි වාර්තාවට අදාළ ඉල්ලුම් පත්‍රය

16. ව්‍යාපාරය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්

17. 1. සුළු ප්‍රාග්ධනයකින් ඇරඹිය හැකිවීම.
2. ආරම්භ කිරීම පහසුවීම.
3. ස්වාධීනව තීරණ ගත හැකිවීම.
4. සියළු ලාභ අයිතිකරු සතුවීම.

18.
1) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
2) ප්‍රාග්ධනය සපයා ගැනීම අසීරු වීම
3) අයිතිකරුගේ වගකීම අසීමිත වීම
4) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
5) අලාභ තනිව භුක්ති විඳීමට සිදු වීම

19.

1) හවුල්කරුවන් 2 – 20 අතර සිටිය යුතු වීම
2) හවුල්කරුවන් අතර ගිවිසුම්ගත සම්බන්ධතාවක් පැවතීම
3) අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම
4) හවුල්කරුවන්ගේ වගකීම් අසීමිත වීම

20.
1) ලිඛිතව
2) වාචිකව
3) ව්‍යංගයෙන්

21. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේ දී හවුල් කරුවන්ට ඇතිවන ගැටළු හා මතභේද නිරාකරණය කර ගැනීම සඳහා ලිඛිත හවුල් ගිවිසුමක් පැවතීම යෝග්‍ය වේ.

22. හවුල්කරුවන් විසින් ඇති කර ගන්නා ලිඛිත ගිවිසුමයි.

23.

1) හවුල්කරුවන් ප්‍රාග්ධනය සපයන ආකාරය
2) ලාභ අලාභ බෙදා ගන්නා ආකාරය
3) ව්‍යාපාරයේ කටයුතුවලට දායක වන ආකාරය
4) හවුල් වේතන ලබා ගන්නා ආකාරය
5) හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්

24.
1) වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම
2) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
3) වගකීම් හවුල්කරුවන් අතර බෙදී යාම
4) සාමූහික තීරණ ගත හැකි වීම

25.
1) වගකීම අසීමිත වීම
2) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
3) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
4) ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම
5) සාමූහික තීරණ ගැනීමේදී ඇතිවන අපහසුතා

26.
1) සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ යුතු වීම
2) කොටස්කරුවන් මඟින් ප්‍රාග්ධනය රැස්කර ගැනීම
3) කොටස්කරුවන්ගේ වගකීම සීමිත වීම
4) අඛණ්ඩ පැවැත්මක් තිබීම
5) නෛතික පුද්ගලභාවයක් පැවතීම
6) කළමනාකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් සිදු කිරීම

27. සාංගමික ව්‍යවස්ථාවලිය

28.

1) සමාගමේ පරමාර්ථ
2) කොටස් හිමියන්ගේ බැඳීම් හා අයිතිවාසිකම්
3) සමාගමේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු

29.

1) සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය
2) සාංගමික ව්‍යවස්ථාවලිය
3) සමාගමේ අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කිරීමට ඒ ඒ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශ
4) සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට එම ලේකම්වරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය

30. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා

31. 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාල සමාගමට නිකුත් කරන සහතිකයයි.

32. කොටස්කරුවන් අවම 01 සහ උපරිම 50 වේ.

1) වගකීම් සීමාසහිත වේ.
2) කොටස් මිලදීගැනීමට මහජනතාවට ඇරයුම් කළ නොහැක
3) අඛණ්ඩ පැවැත්මක් ඇත.
4) නෛතික පුද්ගලභාවයක් ඇත

33.

1) තනි පුද්ගලයෙකුට වුවත් ආරම්භ කළ හැකි වීම
2) වගකීම් සීමිත වීම.
3) නෛතික පුද්ගලභාවයක් පැවතීම
4) අඛණ්ඩ පැවැත්මක් තිබීම

34.

1) වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගැනීම අපහසුවීම
2) අනිවාර්යෙන් පිළිපැදිය යුතු නීති රීති පැවතීම
3) උපරිම කොටස්කරුවන් 50 වීම නිසා විශාල පිරිසක් ව්‍යාපාරයට සම්බන්ධ කර ගත නොහැකි වීම

35.

1) තනි පුද්ගල ව්‍යාපාර ලෙස
2) හවුල් ව්‍යාපාර ලෙස
3) සංස්ථාපිත සමාගම් ලෙස

36.

1) වරලත් හිමියා
2) වරලත් ලාභියා

37.

1) වරලත් ගිවිසුම

38.

1) වරලත් හිමියා
2) වරලත් ලාභියා

39. පුරස්කාරය

40.

1) වරලත් හිමියා විසින් සපයන සේවා
2) අලෙවි කළ යුතු භාණ්ඩ/ සේවා වර්ග
3) වරලත් හිමියාට ගෙවන පුරස්කාරයේ වටිනාකම

41.

1) දෙපාර්ශ්වයක් සම්බන්ධ වීම (වරලත් හිමියා විසින් වරලත් ලාභියා)
2) ගිවිසුම්ගත සම්බන්ධතාවයක් පැවතීම
3) වරලත් ලාභියා විසින් වරලත් හිමියාට ගෙවීමක් කිරීම

42.

**<u>වරලත් හිමියා</u>**

1) තමාගේම ආයෝජනයකින් තොරව ව්‍යාපාර කටයුතු පුළුල් කර ගත හැකි වීම
2) ආදායමක් ලබා ගත හැකි වීම (පුරස්කාරය)
3) විශාල සේවක පිරිසක් පවත්වා ගැනීමෙන් දැරීමට සිදු වන පීඩනය අවම වීම

**<u>වරලත් ලාභියා</u>**

1) ජනප්‍රිය වෙළෙඳපොළකට පහසුවෙන් පිවිසිය හැකි වීම
2) වරලත් හිමියාගේ කීර්ති නාමයෙන් ලාභ ඉපයිය හැකි වීම
3) වරලත් හිමියාගෙන් කළමනාකරණ පුහුණුවක් ලැබීම

43.

1) ව්‍යාපාර කටයුතු කිරීමේ දී නෛතික බැඳීම් හා සීමාවන්ට යටත් වීමට සිදු වීම
2) අසාර්ථක වෙළෙඳ කටයුතු නිසා වරලත් හිමියාගේ කීර්තිනාමය පළුදු වීම
3) වරලත් ලාභියාට පූර්ණ ස්වාධීනත්වයකින් කටයුතු කළ නොහැකි වීම

44.

i. කේවල ස්වාමි ව්‍යාපාර

ii. තමා ඉතිරි කරගත් මුදල්
ඉඩමක් විකුණා ලබා ගත් මුදල්



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

iii. ව්‍යාපාරය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලියාපදිංචියට අදාල ලියකියවිලි ඉදිරිපත් කිරීම තුළින්

iv. හවුල් ව්‍යාපාරයක් ලෙස

v. ලිඛිත හවුල් ගිවිසුමක් පවත්වාගෙන යාමෙන්

45.

i. වාචිකව, ලිඛිතව, ව්‍යංගයෙන්

ii.

**ස්වීට් ෆුඩ් හවුල් ව්‍යාපාරය**
**හවුල් ඔප්පුව**

- හවුල්කරුවන් දෙදෙනා රු.100 000 බැගින් ප්‍රාග්ධනය යෙදිය යුතුය.
- ලාභ සහ පාඩු සම සමව බෙදා දිය යුතුය
- ජයනිට මාසිකව රු.25 000ක වේතනයක් ගෙවිය යුතුය.
- ප්‍රාග්ධනයට අතිරේකව සපයන ණය සඳහා 10%ක වාර්ෂික පොළියක් ගෙවයි.
- යෙදූ ප්‍රාග්ධනය සඳහා 5%ක වාර්ෂික පොළියක් හිමි වේ.
- නව හවුල්කරුවෙක් බඳවා ගන්නේ නම් ඒ සඳහා දෙදෙනාගේම කැමැත්ත තිබිය යුතුය.

iii.

හවුල් ව්‍යාපාර සඳහා නෛතික පුද්ගලභාවයක් නොමැති බැවින් ව්‍යාපාරයේ නමින් නඩු පැවරිය නොහැක. නඩු පැවරිය යුත්තේ සේනානි සේනාරත්න සහ ජයනි ජයරත්න යන නම් වලිනි.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව